# ජාතිවාදය අවුස්සපු එවුන් රට කන්න ආපු දේශද්‍රෝහී රැළක්

මහින්ද මහරජාණෝ නියෝගයක් කරල තිබුණ දැන් ලංකාවේ ජාතීන් නැති අතර ඇත්තේ දේශද්‍රෝහීන් හා දේශප්‍රේමීන් පමණයි කියල. මේකත් එක විදියකින් ඇත්ත වෙමින් යනවා.

රාජ නියෝගය අවතාරයක් වගේ කැබිනෙට්ටුවත් පලාගෙන එළියට ඇවිත් පාර්ලිමේන්තුවත් දෙකට බෙදල තියෙනව. ඊළඟට ඒ ඒ පක්ෂ බෙදාගෙන ගමන් කරමින් මේ අවතාරය දැන් පන්සල්, පල්ලි, දේවස්ථාන, සංඝ සභාවල්, දේව සභාවල් විනිවිද ගෙන දෙබෑ කරමින් ගමන් කරනව.

පක්ෂ දෙබෑ වෙලා. නීති මණ්ඩල, සරසවි මණ්ඩල, ශිෂ්‍ය සංගම් මේ අලුත් නියමයට යට වෙලා ඉවරයි. දැන් බලය බෙදීමට පක්ෂ දේශප්‍රේමීන් හා බලය බෙදීමට විපක්ෂ දේශද්‍රෝහීන් හැටියටයි මේ නියමය දැන් ක්‍රියාත්මක වෙන්නේ.

මගේ ටෙලිෆෝන් එක හැමදාම වගේ වදිනව මගේ දේශප්‍රේමී විවරණ ගැන අහන්න. මෙරට ඊනියා බුරුම ඒකාධිපති ගමනින් ගෙනියන්න දඟලන මේ රටේ ජනතාව බේද කරල වහල් කරගන්න බලන බලය බෙදීමට, පලාත් සභාවලට විරුද්ධව මිනීමරු කල්ලිවල ඇත්ත ස්වභාවය දැන් දැන් එළිවෙන්නට පටන් අරන්.

> "යුද්ධය කළේ අපට බලය ගන්න මිස පලාත් සභාවලට, ජාතීන්ට, ජනතාවට බලය බෙදා දෙන්න නෙවෙයි"

මේ තමා මේ දේශද්‍රෝහි කල්ලිවලින් නැගෙන හඬ.

ඒ ගොල්ලෝ රජාණෝට අත් දික්කරල, ඇඟිල්ල දික් කරල අහනව,

> "කියපන් මහින්ද උඹ අප සමඟද නැත්නම් වික්‍රමබාහුල සමඟද"

කියල.

ඒත් ඒක, පත්තරකාරයෝ, ජනමාධ්‍යකාරයෝ සෝරනාඩු කළේ වික්‍රමබාහුලා සල්ලිවලට කැහැපු එවුන් කියලයි. ඒත් දැන් බැලුවහම ඇත්තටම දේශප්‍රේමීන් ලෙස වැඩ කරල තියෙන්නේ අපියි.

**රට ගොඩ නගන්න නම් මේ රට තුළ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරළියක් කළ යුතු වෙනව. මේ පෙරළිය තුළින් ඇති වන නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජය හරහායි සංවර්ධනයට ඇතුල් වෙන්න ඉඩ ලැබෙන්නේ.**

ජාතිවාදය අවුස්සපු එවුන් රට කන්න ආපු දේශද්‍රෝහී රැළක් කියල හැමෝටම පිළිගන්න වෙන පාටයි.

දැන් ගෝලීය බලවතුන්ටත් වඩා මේ රට තුළ ඉන්න දෙමළ ජනතාව වෙනුවෙන් විසඳුම් තිබිය යුතු බව කියන්නේ ලංකාව වෙනුවෙන් ඡන්දය දීපු රටවල් 29 යේ ඇත්තෝ කියලයි කියන්නේ.

රට ගොඩ නගන්න නම් මේ රට තුළ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරළියක් කළ යුතු වෙනව. මේ පෙරළිය තුළින් ඇති වන නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජය හරහායි සංවර්ධනයට ඇතුල් වෙන්න ඉඩ ලැබෙන්නේ.

අපේ අඩු දියුණුකමේ විශේෂ හේතුව මේ විදියට නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ඇති කරගැනීමට ධනපති පාලකයන්ට හැකි නොවීමයි.

ඒ නිසා තමයි නිර්ධන පංතියට එම කටයුත්තේ බර කරට වැටිල තියෙන්නේ.

ධනපති පාලකයෝ වුණත් පොඩ්ඩක් හරි ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් දෙසට තල්ලු වුණේ කම්කරු පංතියේ නැගිටීම උඩයි. මෙය පසුගිය සියවස තුළ ඇති වුණ වෙනස්කම තුළිනුත් බලාගන්නට පුළුවන්.

**ආණ්ඩුවම මානව හිමිකම් ගැටළුවේදි කිව්වේ ත්‍රස්තවාදීන්ට විරුද්ධ සටනයි, දෙමළ ජනතාවගේ පාලන අයිතියයි පටලවා ගත යුතු නැති කරුණු දෙකක් බවයි. ඒ අනුව ඔවුන් තර්ක කළේ දෙමළ යුදමය නැගිටීම මර්ධනය කළහම දෙමළ ජනතාවගේ ඇත්ත දේශපාලන ඉල්ලීම් මතු වී එළියට එන බවයි.**

නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රටක් ඇති වීමට නම් පළමුවෙන්ම විදේශ බලවතුන්ගේ කොල්ලකෑම් නතර කරගත යුතුයි.

එය ආනයන අපනයන හා විදේශ ගනුදෙනු ප්‍රශ්නයක් හැටියටයි මූලිකව අද දවසේ මතුවෙලා තියෙන්නේ. එහෙම නැතිව විදේශ හමුදා කඩා පැනීමට නම් ඉඩ අඩුයි.

ඒත් මානව හිමිකම් කඩවීමේ ප්‍රශ්න උඩ විදේශ හමුදා කඩාපැනීමේ ප්‍රශ්නයත් මතු වුණා.

ඒ තුළින්ම අපට පෙනෙනවා නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රටක ජාතික සමඟිය අනිවාර්යයෙන්ම ගොඩනැගිය යුතු දෙයක්. ජාතික සමඟිය බලයෙන් දෙමළ මුස්ලිම් ජනතාව සිංහලකරණය කිරීමෙන් ඇති කරන්නට බෑ.

එනිසා තමයි බලය බෙදීම නිදහස් අරගලයේ ඉතාම අවශ්‍ය අංගයක් බවට පත්වෙන්නේ. දැන් විමල්, චම්පික, දිනේශ් ආදීන් පෙන්වන්න හදන්නේ දෙමළ යුදමය නැගිටීම අවසන් වූ නිසා ප්‍රශ්නයක් නෑ කියලයි.

ඒත් ආණ්ඩුවම මානව හිමිකම් ගැටළුවේදි කිව්වේ ත්‍රස්තවාදීන්ට විරුද්ධ සටනයි, දෙමළ ජනතාවගේ පාලන අයිතියයි පටලවා ගත යුතු නැති කරුණු දෙකක් බවයි.

ඒ අනුව ඔවුන් තර්ක කළේ දෙමළ යුදමය නැගිටීම මර්ධනය කළහම දෙමළ ජනතාවගේ ඇත්ත දේශපාලන ඉල්ලීම් මතු වී එළියට එන බවයි.

එහෙම නම් දැන් ඒ ඉල්ලීම් ඉදිරිපත් වෙලා කියල පිළිගන්න වෙනව. දෙමළ ජනතාවගේ ලොකුම ඉල්ලීම 13 ව්‍යවස්ථා සංශෝධනයට වඩා බලවත් බලය බෙදීමක් අවශ්‍ය බවයි. එහෙම නම් ඒ ගැන ආණ්ඩුව හිත යොමු කළ යුතුයි.

ජාතිවාදී නඩයන් තර්ක කරන්නේ ඔය විදියට පොලිස් බලතල සහිත ප්‍රාන්ත ආණ්ඩු හදනව නම් ඇයි යුද්ධයක් කර මේ තරම් ජනතාවක් මරණයට හා ආබාධයන්ට පත් කළේ කියන එකයි.

ඒකට නම් අපිත් එකඟයි.

ඇත්තටම යුද්ධයක් නොකර බලය බෙදීම එළියට ගත්ත නම් දෙමළ ජනතාවගේ විශ්වාසය එයින් ලබාගන්න තිබුණ. එහෙම නම් වෙනම රාජ්‍ය අදහස නිකම්ම නැති වෙලා යනව.

යුද්ධයක් නොකරම කොටි සංවිධානය අසීරු තැනකට එවිට පත්වෙනව. මොකද? දෙමළ ජනතාවට නිදහස ලැබෙනවා නම් ඇයි හමුදා ක්‍රියාමාර්ග තවදුරටත් ගෙනියන්නේ කියන ප්‍රශ්නය දෙමළ ජනතාව තුළම ඇති වන නිසා.

කොහොම වුණත් දැන් අනෙක් අතට එම ප්‍රශ්නය මතුවෙලා. දෙමළට බලය දෙනව නම් ඇයි යුද්ධ කළේ කියල විමල්ලා අහන කොට අපිටත් කියන්න තියෙන්නේ

> "ඔව්, ඇත්ත. යුද්ධ කරපු එක වැරදියි"

කියලයි.

කොහොම වුණත් ඔය තර්කවලට වඩා දැන් මතුවෙන්නේ 13 ව්‍යවස්ථා සංශෝධනය වඩා පණ පොවල ක්‍රියාත්මක කරනවද, නැත්ද කියන ප්‍රශ්නයයි.